

# කොඩියගෙ ළම

ලක්ෂමන් කොඩිතුවක්කු

මහ රෑ  ඇසුණු රතිඤ්ඤා සද්දයකින් මම දඩින් බිඩින් ඩෝං ගා රෝස මල් පිරුණු යහනාවෙන් ඇහැරුණෙමි. "කවුද යකෝ මේ මහ රෑ කෝල් කරන්නෙ." මම නිදිමරගාතෙන් කෑ ගැසුවෙමි. මගේ පෝන් එක තුළින් ඇසෙන්නේ රතිඤ්ඤා හඬය. අපේ රටේ සවුත්තු පුතෙක් රතිඤඤා පත්තු කරමින් මගේ ෆෝනයට හඬ එවන්නෙ නෝංජල් සිනහවක් සමගිනි.

"මාමෙ මාමෙ අපි ප්‍රිතිය සමරනවා" ඒ අපේ වරිගෙ පුතෙකි.

"ජාතිය වෙනුවෙන්ද පුතේ." මම කබ කඩමින් ඈනුම් අරිමින් ඇසුවෙමි.

"නෑ මාමෙ මහින්ද අගමැති වීමේ ප්‍රීතිය නිමිත්තෙන්"

"මහින්ද අගමැති වෙන්නෙ කොහොමද. රනිල්නෙ අගමැති. උඹට පයිත්තියන්ද?"

"පයිත්තියන් නෑ මාමෙ. මං සුස්තියක් ගහල ඉන්නෙ.  අපේ ලොක්ක මෛත්‍රී ඔන්න හිටන් කියල මහින්දව අගමැති කළා.  ඔක්කොම කඩ වහල තියෙන වෙලාවෙ රතිඤඤා කඩ ඇරලා. සුබිත මුදිත රට පුරාම මමත් වැලේ වැල් නැතිව හරි වැල් තුනක්ම පත්තු කළා. අන්න ආච්චි කිරිබත් උයනව."

"ආච්චි කිරිබත් උයන්නෙ කොහොමද බං. ගෙදර හාල් ඇටයක් නැහැ කීයක් හරි එවපන් පුතේ කියලනෙ මට කෝල් කරන වෙලාවෙ කිව්වෙ"

"මේ වගෙ වෙලාවට හාල් තියෙනව මාමෙ. කඩේ මුදලාලි ප්‍රීතිය සමරන්න කඩේ දිවා රාත්‍රී කරල ණයට බඩු දෙනවා"

වරිගයේ එකෙක් උවත් මං ඌව විශ්වාස කරන්නේ නැත. අපේ දේශපාලන ගොයියන්ටත් වඩා පාලකයෝ නියෝජනය කරමින් බොරු බේගල් ගොතන උගේ හඬට කන් නොදී මං මෛත්‍රීට ඇමතුමක් ගත්තෙමි.

"සර්. රටේ අගමැති කවුද සර්?"

"මුලින්ම කියපන්කො කවුද ඔය කතා කරන්නෙ කියල?"

"මේ මං.........."

"ආ උඹද කොල්ලො. උඹට නොකිය බෑනෙ. රටේ ආර්ථිකෙත් එක්ක රුපියලත් පල්ලම් බැහැල තියෙන වෙලාවෙ උඹල එවන ගතමනාවෙන්නෙ බං අපි සැප විඳින්නෙ."

"ඒ අගමැති කතාව ඇත්තක්ද සර්" මම ගාම්භීරව ඇසුවෙමි.

"ඔව්නෙ බං. බලපං වෙච්ච දෙයක්. මහින්ද අගමැති උනානෙ. මාත් පත්තෙරෙන් තමයි දැක්කෙ."




"ඉතින් අර සර් ළග මහින්ද මහත්තය දිවරුම් දෙන පොටෝ එකක් දාල තියෙන්නෙ. මං කතා කරන ගමන් පෝන් එකෙන් දැක්කෙ"

"ඒ දිව්රුං දෙනව නෙමෙයි බං. මාව ආපහු අඩි හයක් පොළොව යටට යවන්නෑ කියල දිව්රුං දෙන පොටෝ එකක් ඒක. අනෙක මං රුපියල බාල්දු කරල දැම්ම වගේම මිනිහවත් මස්තබාල්දු කරල දැම්ම. රජ පාටි ගොං පාටි කළා බං. අනෙක මෑන් පොරොන්දු උනා මීළග ජනාදිපති ගේම් එකේදි මං වෙනුවෙන් කඩේ යන්න. ඔන්න බලාගෙන හිටපල්ල මිනිහා මුළු ලංකාවම කවර් වෙන්න මට සපෝර්ට් කරනව. මෛත්‍රී අපිට රජෙක්. අපේ රට ගොඩගන්න ආපු දියසේන කුමාරයා කියල කෑගහල කියනව කිව්ව. මට තියෙන්නෙ ඒ වෙනුවෙන් පයිල් ටික හංගන එක විතරයි"

"සර් ඒකෙ අනිත් පැත්ත වෙයිද දන්නෑ"

"මොකක්ද ඒකෙ අනික් පැත්ත. මට පස්ස පෙන්නපු එවුන්ට මාත් පස්ස පෙන්නල තියෙන්නෙ."

"නෑ සර්. සර් කියයිද දන්නෑ ආපහු මහින්ද අපිට රජෙක් කියල. එහෙම කිව්වොත්නෙ සර් ආපහු මහින්දගෙ ජන්ද ටික ගන්න පුලුවන්"

"යකෝ යූ ඇන්පී ජන්දවලින් ආපු මට මහින්දට ආපහු රජෙක් කියන එකත් මහ ලොකු කප්ජක්ද බං"

"සර් ඒ කාලෙ තව කියපු එකක් මට මතක් උනා"

"මොකක්ද බං. කියපං ඉක්මණට. මළ වදේ. මට ඇමති ගොංරැළ පත්කරගන්න තියෙනවා"

"සර් කිව්වෙ මහින්දට අලුත් පක්ෂ හදන්න ඉඩ තියන්නෑ. පාරක් පාරක් ගානෙ ඇව්ද්දෝනව කියල"

"ඉතින් ඒක තමයි යකෝ කලේ. අගමැති උනාම නිකං ඉන්න පුලුවන්ද. මගේ ගුණ කිය කියා පාරක් පාරක් ගානෙ රැස්වීම් තිය තියා ඇව්දින එක පොඩි වැඩක්ද"
මම මෛත්‍රීට සමුදී මහින්දට ඇමතුමක් ගත්තෙමි.

"ආ අගමැතිතුමා කොහොමොද?"

"ආ මේ අපේ කොල්ලෙක්නෙ කොහොමද පුතේ.  දැන් වෙනස සැපද?"
"මේ දවස්වල ටිකක් හෙම්බිරිස්සාව සර්. නහය ණය බර වෙලා.

"ඇයි සර් ඒ ?"
 "අර  සිරිලිය කේස්... තාජුඩීන්ලගෙ කේස්... අනෙක ගහපු ගැහිලිවල නඩු අහන පයිල් ටික යට ගහල නඩු චකබිලාස් කරල දෙන්න කියල මළ වදේ"

"ඉතින් කොහොමද සර් ඒව බිලාස් කරන්නෙ?"

"මෙහෙමනෙ පුතේ. මං අගමැති වෙලා දවස් විසි එකක් පාර්ලිමේන්තුව වහල දාල විවේක ගන්නවනෙ. ඒ දවස් විසි එක හොඳටෝම ඇති ඔය පයිල් ටික චක බිලාස් කරන්න"
ඉන්පසු මං රනිල්ට ඇමතුමක් ගත්තෙමි.

"හරි වැඩේ උනේ නේද සර්?"

"නෑ බං මංමයි කිව්වෙ මහින්දව අගමැති කරන්න කියල"

"ඇයි සර් එහෙම පරිත්‍යාග සීලවන්තයෙක් උනේ?"

"ඇයි බං මහින්දයගෙ කාලෙ වෙලා තියෙන ණය කන්දරාව මට බේරන්න පුලුවන්ද මං කිව්ව මෛත්‍රීට මහින්දයටම දීල ඔය ටික බේරල දාන්න කියල. අනෙක බැදුම්කරේ  හොරා කාපු සල්ලි ටිකත් එහාට මෙහාට කරල දාන්න මහින්දය පොරොන්දු උනානෙ"

ඉතින් කොහොමහරි අගමැති උනා නේද.
හරි හොරා"
"ඔව් බං. මං වෙන්න නෙමෙයි හිටියෙ. මේ ශිරන්තිගෙනුයි යෝෂිතලගෙන් බේරෙන්න බෑනෙ. ඊට වැඩිය හපන් අර වීරවංශය"

රතිඤ්ඤා පත්තු කරන, කිරිබත් කන ජනතාව ගැන ක්ෂණිකව ඇතිවූ  දුකින් බර සතුටු කඳුළු හේතුකොට ගෙන ඇතිවූ සන්ධි අමාරුවෙන් මම දුරකතනය විසන්ධි කළෙමි.


